සැ. යු. — 2015.10.02 දින පළ වූ අංක 1935 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,936 - 2015 ඔක්තෝබර් මස 09 වැනි සිකුරාදා - 2015.10.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1396 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1402 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය*** **පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ඔක්තෝබර් මස 30 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ඔක්තෝබර් මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

## නුවරඑළිය මහා නගර සභාව

නුවරඑළිය මහා නගර සභාවේ දැනටමත් පුරප්පාඩු වී ඇති පහත සඳහන් ප්‍රාථමික (ශිල්පීය නොවන) තනතුරු සඳහා බඳවා ගැනීමට සභා බල ප්‍රදේශයේ පදිංචි සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :-

01. PL 1 -2006 A

| | | | |
|---|---|---|---|
| 1. | උද්‍යාන පරිපාලක | III | 01 |
| 2. | වැඩ ක්ෂේත්‍ර පරිපාලක | III | 01 |
| 3. | සෞඛ්‍ය පරිපාලක | III | 02 |

*වැටුප් ක්‍රමය* .– රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600
(06/2006(iv) ට අනුව අනුරූපී පියවර තැබිය යුතුයි.)

02. *වැටුප් පරිමාණය* .– මෙම තනතුරට අයත් වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006(iv) හි (PL 1 - 2006 - A අනුව රු. 11,730 -10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 වේ. (III ශ්‍රේණියට බඳවාගෙන වසර තුනක් (03ක්) ගත වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

03. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

3.1 සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු අතර මනා සෞඛ්‍ය තත්වයකින් සිටිය යුතුය.

3.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (අදාළ පළාත් පාලන ආයතනයේ සේවයේ යෙදී සිටින ස්ථිර තනතුරු දරන අය සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

3.3 නුවරඑළිය මහා නගර සභා බල ප්‍රදේශය තුළ වසර 03කට නොඅඩු ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා ප්‍රමාණවත් සුදුස්සන් බල ප්‍රදේශය තුළ නොමැති වූ විටෙක පමණක් යාබද පළාත් පාලන බල ප්‍රදේශයන් හි අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු ඇත.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

4.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය;

4.2 වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය;

4.3 නාගරික කොමසාරිස් විසින් නියම කරනු ලැබුවහොත් බල ප්‍රදේශය තුළ පදිංචි විය යුතු ය;

4.4 පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. II වැනි, I වැනි හා විශේෂ පන්තියේ තනතුරකට උසස් කරනු ලබන සෑම තැනැත්තකුම එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාලයකට යටත් විය යුතු ය;

4.5 III වැනි පන්තියේ තනතුරු දරන්නන් තුන් අවුරුදු ආධුනික කාලය අවසානයේ දී ද අනෙක් පන්තීන්ට අයත් තනතුර දරන්නන් එක් අවුරුදු පරීක්ෂණ කාලය අවසානයේ දී ද වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක වන තැනැත්තන්ගේ පත්කිරීම ස්ථිර කිරීම සළකා බලනු ඇත;

4.6 නාගරික කොමසාරිස් විසින් නියම කරනු ලබන්නේ නම් ඒ ආකාරයෙන් ප්‍රමාණවත් ඇප මුදලින් හෝ නියම කරනු ලබන වෙනත් ආකාරයකින් තැන්පත් කළ යුතුය;

4.7 ආයතන සංග්‍රහයේ 11 වැනි පරිච්ඡේදයේ බඳවා ගැනීම සඳහා වන අනෙකුත් පොදු කොන්දේසි අදාළ විය යුතු ය;

4.8 රජයේ පළාත් සභාව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් පාලන කොමසාරිස්, නාගරික කොමසාරිස් විසින් දැනටමත් නියම කර ඇති හා කලින් කල නියම කරනු ලබන කොන්දේසිවලට යටත් විය යුතු ය;

4.9 සේවයේ නියුක්ත කරන තැනැත්තන් පළාත් පාලන ආයතන අතර, ස්ථාන මාරු කිරීම්වලට යටත් වේ. පළාත් පාලන ආයතන අතර ස්ථාන මාරු කිරීම කොමසාරිස්වරයා විසින් සිදු කරනු ඇත;

4.10 01/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව 2007.07.01 වැනි දින සිට පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳී වසර 05ක් ඇතුළත සේවයට බැඳුන භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ලබාගත යුතු අතර, නියමිත කාලය තුළදී සුදුසුකම් සම්පූර්ණ කිරීමට අපොහොසත් වන තැනැත්තන්ගේ වැටුප් වර්ධක නතර කරනු ලැබේ.

05. *බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් :*

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එක් වරකදී සමත්වී තිබිය යුතුයි.

06. *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුටම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුයි. දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

07. *බඳවා ගැනීමේ ක්‍රමය :*

7.1 අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට යොමු කරනු ලැබේ. සුදුසුකම්ලත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය ඉදිරියේ දී දැනුම් දෙනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණයට පහත සඳහන් ලිපිලේඛන හා ඒවායේ ඡායාස්ථ පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(i) උප්පැන්න සහතිකයේ මුල් පිටපත ;
(ii) අදාළ අධ්‍යාපන සහතිකයේ මුල් පිටපත/ විදුහලේ අස්වීමේ සහතිකය;
(iii) මෑතක දී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය;
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්;
(v) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික;
(vi) සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකය.

7.2 සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයදුම්කරුවන් අතරින් වඩාත්ම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තෝරාගෙන තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

7.3 නුවරඑළිය මහා නගර සභාවේ දැනට තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

08. *අයදුම් කළ යුතු ආකාරය:*

8.1 එක් අයදුම්කරුවෙකුට අයදුම් කළ හැක්කේ එක් තනතුරක් සඳහා පමණි.

8.2 නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත පරිදි A4 ප්‍රමාණයේ කොළයක දෙපැත්තම භාවිතාකර සකස් කරන ලද අයදුම්පතක්, 2015.11.06 වැනි දින හෝ ඊට පෙර, නාගරික කොමසාරිස්, මහා නගර සභාව, නුවරඑළිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. (අයදුම්පත පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් ය.).

8.3 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ''නුවරඑළිය මහ නගර සභාවේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම'' යන්න සඳහන් කළ යුතු ය.

8.4 අසම්පූර්ණ හෝ නියමිත දිනය පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.5 අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ වාර්ෂික වැටුප රු. 2,40,360ක් හෝ ඊට වැඩි රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

8.6 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.

09. බඳවාගනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මකවන දිනය නුවරඑළිය මහ නගර සභාව විසින් නිශ්චය කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන කාලය අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය නාගරික කොමසාරිස්වරයා සතුය.

පී. ජී. සුනිල් අබේකෝන්,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
නුවරඑළිය.

2015 සැප්තැම්බර් මස 25 වැනි දින,
නුවරඑළිය මහා නගර සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**මධ්‍යම පළාතේ නුවරඑළිය මහා නගර සභාවේ .................................................................. තනතුර සඳහා ඉල්ලුම්පත්‍රය**

01. (i) මුලකුරු සමග නම :——————————.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————.
ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය :——————————. නම :——————————.
03. ස්ථිර පදිංචි ලිපිනය:——————————.

04. ජාතික හැඳුනුම්පත් අංකය:————————————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය:————————————. විවාහක/අවිවාහක බව :————————————.
06. ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස ෑ අවුරුදු :———. මාස:———. දින:———.
නුවරඑළිය මහා නගර සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය අවුරුදු :———. මාස:———. දින:———.
07. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද, ලියාපදිංචියෙන් ද යන වග:————————————.
තොරතුරු සඳහන් කරන්න :————————————.
08. අධ්‍යාපන සුදුසුකම් (සමත් විභාග පිළිබඳ විස්තර)ඃ
(i) සමත්වූ වසර/ශ්‍රේණිය :————————————.
(ii) අ.පො.ස. සා/පෙළ විභාගය :————————————.
විභාග අංකය:————————————. විභාග වර්ෂය හා මාසය:————————————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ.පො.ස. උ/පෙළ විභාගය :————————————.
විභාග අංකය:————————————. විභාග වර්ෂය හා මාසය:————————————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |
| | | | |

09. වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතු ය.):————————————.
10. සේවා පළපුරුද්ද :————————————.
(i) දැනට සේවය කරන ආයතනය:————————————.
(ii) දැනට දරන තනතුර:————————————.
(iii) එම තනතුරට පත් වූ දිනය:————————————.
(iv) ඊට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර:————————————.

11. ඔබ කවරදාක හෝ චෝදනාවක් මත උසාවියකින් වරදකරු කර තිබේ ද ?:————————————.
එසේ නම් ඒ පිළිබඳ විස්තර :————————————.

12. *අයදුම්කරුගේ සහතිකය ෑ*

මෙම ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක්/තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා තනතුරට නුසුදුස්සකු වන බවත්, මා තනතුරකට පත් කිරීමෙන් පසු තොරතුරු/විස්තර වැරදි හෝ අසත්‍ය බව සොයා ගතහොත් එයින් මා තනතුරට නුසුදුස්සකු වන බවත්, කිසිම වන්දියක් නොමැතිව තනතුරෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:————————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා වන ආයතන ප්‍රධානියාගේ සහතිකය ෑ*

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ..................................... මහතා/මහත්මිය/මෙනවිය ........................... දින සිට මෙම කාර්යාලයේ ................................................ වශයෙන් සේවය කරනු ලබයි. ඉහත තනතුරට තෝරා පත්කරගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව යොදන්න).

නම :————————————.
පදවි නාමය :————————————.
දෙපාර්තමේන්තුව/ආයතනය :————————————.
දිනය:————————————.

10-478/1

## නුවරඑළිය මහ නගර සභාව

නුවරඑළිය මහ නගර සභාවේ දැනටමත් පුරප්පාඩු වී ඇති පහත සඳහන් ප්‍රාථමික (ශිල්පීය) තනතුරු සඳහා බඳවා ගැනීමට සහා බල ප්‍රදේශයේ පදිංචි සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. PL 3 -2006 A

1. බර වාහන ක්‍රියාකරු III 01

*වැටුප් ක්‍රමය* .– රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860

02. *වැටුප් පරිමාණය* .- මෙම තනතුරට අයත් වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006(iv) හි PL3-2006-A අනුව රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 වේ. (III ශ්‍රේණියට බඳවාගෙන වසර තුනක් (03ක්) ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

03. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි* :

3.1 සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.

3.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (අදාළ පළාත් පාලන ආයතනයේ සේවයේ දැනටමත් සේවයේ නියුතු අය සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

3.3 නුවරඑළිය මහ නගර සභා බල ප්‍රදේශයේ අඛණ්ඩව වසර 03ක් පදිංචිකරුවෙකු විය යුතු ය.

*සටහන* .– පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා ප්‍රමාණවත් සුදුස්සන් බල ප්‍රදේශය තුළ නොමැති වූ විටෙක පමණක් යාබද පළාත් පාලන බල ප්‍රදේශයන්හි අයදුම්කරුවන්ගේ අයදුම්පත් සළකා බලනු ඇත.

3.4 සියලුම අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතු ය.

3.5 මහා මාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතු ය.

04. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි* :

4.1 මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය;

4.2 වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය;

4.3 නාගරික කොමසාරිස් විසින් නියම කරනු ලැබුවහොත් බල ප්‍රදේශය තුළ පදිංචි විය යුතු ය;

4.4 පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. II වැනි, I වැනි හා විශේෂ පන්තියේ තනතුරකට උසස් කරනු ලබන සෑම තැනැත්තෙකුම එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාලයකට යටත් විය යුතු ය;

4.5 III වැනි පන්තියේ තනතුරු දරන්නන් තුන් අවුරුදු ආධුනික කාලය අවසානයේ දී ද, අනෙක් පන්තීන්ට අයත් තනතුරු දරන්නන් එක් අවුරුදු පරීක්ෂණ කාලය අවසානයේ දී ද වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක වන තැනැත්තන්ගේ පත්කිරීම ස්ථිර කිරීම සළකා බලනු ඇත ;

4.6 නාගරික කොමසාරිස් විසින් නියම කරනු ලබන්නේ නම් ඒ ආකාරයෙන් ප්‍රමාණවත් ඇප මුදලින් හෝ නියම කරනු ලබන වෙනත් ආකාරයකින් තැන්පත් කළ යුතු ය;

4.7 ආයතන සංග්‍රහයේ 11 වැනි පරිච්ඡේදයේ බඳවා ගැනීම සඳහා වන අනෙකුත් පොදු කොන්දේසි අදාළ විය යුතු ය;

4.8 රජයේ පළාත් සභාව, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් පාලන කොමසාරිස්, නාගරික කොමසාරිස් විසින් දැනටමත් නියම කර ඇති හා කලින් කල නියම කරනු ලබන කොන්දේසිවලට යටත් විය යුතු ය;

4.9 01/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව 2007.07.01 වැනි දින සිට පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳී වසර 05ක් ඇතුළත සේවයට බැඳුන භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ලබාගත යුතු අතර, නියමිත කාලය තුළ දී සුදුසුකම් සම්පූර්ණ කිරීමට අපොහොසත් වන තැනැත්තන්ගේ වැටුප් වර්ධක නතර කරනු ලැබේ.

*05. බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම්* :

5.1 අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එක් වරක දී සමත්වී තිබිය යුතුයි.

*කායික සුදුසුකම්* :

සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

අවම උස අඩි 05 අඟල් 02, 1/2ක් විය යුතුයි.

*5. 2 වෘත්තීය සුදුසුකම් ඃ*

5.2.1 මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ එක් එක් තනතුරු සඳහා අදාළ වන කාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. ඊට අමතරව යන්ත්‍ර ක්‍රියාකරු තනතුරු සඳහා රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් (NAITA/ICTAD) පුහුණුව ලැබූ බවට ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටමේ (NVQ4) පුහුණු සහතිකය, යන්ත්‍ර ක්‍රියාකරවීමේ පුහුණු සහතිකය.

5.2.2 තාර බර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙනයා හැකි බස් රථ සඳහා රියැදුරු බලපත්‍රයක් තිබීම. (බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.)

05.3 *පළපුරුද්ද ඃ*

මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03ක පළපුරුද්ද ලබා තිබීම (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතු ය.)

06. බඳවා ගැනීමේ ක්‍රමය ඃ

6.1. අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලැබේ.

සුදුසුකම් ලත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය ඉදිරියේ දී දනුම් දෙනු ැලබේ. එම සම්මුඛ පරීක්ෂණයට පහත සඳහන් ලිපිලේඛන හා ඒවායේ ඡායාස්ථ පිටපත් ඉදිරිපත් කළ යුතු ය ඃ-

(i) උප්පැන්න සහතිකයේ මුල් පිටපත ;
(ii) අදාළ අධ්‍යාපන සහතිකයේ මුල් පිටපත/විදුහලේ අස්වීමේ සහතිකය ;
(iii) මෑතක දී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය ;
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් ;
(v) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික ;
(vi) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික ;
(vii) වෘත්තීය පුහුණු පිළිබඳ සහතිකය.

6.2 සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයදුම්කරුවන් අතරින් වඩාත්ම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තෝරාගෙන තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

6.3 නුවරඑළිය මහ නගර සභාවේ දැනට තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

07. *අයදුම් කළ යුතු ආකාරය ඃ*

7.1 එක් අයදුම්කරුවකුට අයදුම් කළ හැක්කේ එක් තනතුරක් සඳහා පමණි.

7.2 නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත පරිදි A4 ප්‍රමාණයේ කොළයක දෙපැත්තම භාවිතා කර සකස් කරන ලද අයදුම්පතක්, 2015.11.06 වැනි දින හෝ ඊට පෙර. නාගරික කොමසාරිස්, මහ නගර සභාව, නුවරඑළිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. (අයදුම්පත පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.)

7.3 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "නුවරඑළිය මහා නගර සභාවේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම" යන්න සඳහන් කළ යුතු ය.

7.4 අසම්පූර්ණව හෝ නියමිත දිනය පසුවී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7.5 අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ වාර්ෂික වැටුප රු. 2,40,360 ක් හෝ ඊට වැඩි රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

7.6 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.

08. බඳවාගනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය නුවරඑළිය මහ නගර සභාව විසින් නිශ්චය කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන කාලය අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය නාගරික කොමසාරිස්වරයා සතුය.

පී. ජී. සුනිල් අබේකෝන්,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
නුවරඑළිය.

2015 සැප්තැම්බර් මස 25 වැනි දින,
නුවරඑළිය මහා නගර සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

**මධ්‍යම පළාතේ නුවරඑළිය මහා නගර සභාවේ ................................................................ තනතුර සඳහා ඉල්ලුම්පත්‍රය**

01. (i) මුලකුරු සමග නම :————————————.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම :————————————.

02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————————. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————————————.
ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය :————————————. නම :————————————.
03. ස්ථිර පදිංචි ලිපිනය:————————————.
04. ජාතික හැඳුනුම්පත් අංකය:————————————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය:————————————. විවාහක/අවිවාහක බව :————————————.
06. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු :——— —. මාස:—————. දින:—————.
නුවරඑළිය මහා නගර සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය :අවුරුදු :————— . මාස :——————. දින:— ————.
07. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද, ලියාපදිංචියෙන් ද යන වග:————————————.
තොරතුරු සඳහන් කරන්න :—————.
08. අධ්‍යාපන සුදුසුකම්: (සමත් විභාගය පිළිබඳ විස්තර) ————————————.
(i) සමත්වූ වසර/ශ්‍රේණිය :————————————.
(ii) අ.පො.ස. සා/පෙළ විභාගය :————————————.
විභාග අංකය:————————————. විභාග වර්ෂය හා මාසය:————————————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ.පො.ස. උ/පෙළ විභාගය :————————————.
විභාග අංකය:————————————. විභාග වර්ෂය හා මාසය:————————————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුය.):————————————.
10. සේවා පළපුරුද්ද :—————.

(i) දැනට සේවය කරන ආයතනය:————————————.
(ii) දැනට දරන තනතුර:————————————.
(iii) එම තනතුරට පත් වූ දිනය:————————————.
(iv) ඊට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර:————————————.

11. ඔබ කවරදාක හෝ චෝදනාවක් මත උසාවියකින් වරදකරු කර තිබේද ?:————————————.
එසේ නම් ඒ පිළිබඳ විස්තර ?:————————————.

12. අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක්/තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා තනතුරට නුසුදුස්සෙකු වන බවත්, මා තනතුරකට පත් කිරීමෙන් පසු තොරතුරු/විස්තර වැරදි හෝ අසත්‍ය බව සොයා ගතහොත් එයින් මා තනතුරට නුසුදුස්සෙකු වන බවත්, කිසිම වන්දියක් නොමැතිව තනතුරෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.

————————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය:————————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය.*

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ............................................ මහතා/මහත්මිය/මෙනවිය ...................................... දින සිට මෙම කාර්යාලයේ ................................................ වශයෙන් සේවය කරනු ලබයි. ඉහත තනතුරට තෝරා පත්කරගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
(නිලමුද්‍රාව යොදන්න.)

නම :————————————.
පදවි නාමය :————————————.
දෙපාර්තමේන්තුව/ආයතනය :————————————.
දිනය:————————————.

10-478/2

# පළාත් පාලන නිවේදන

## අරණායක ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24(2) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය ප්‍රකාර සබරගමුව පළාතේ කෑගලු දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය සභාව විසින් මෙහි අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති මංමාවත/මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවතක්/මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. චන්ද්‍රාවතී,
ලේකම්,
ප්‍රාදේශීය සභාව, අරණායක.

2015 සැප්තැම්බර් මස 16 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| | | |
|---|---|---|
| *මාර්ගයේ නම* | :- | අම්පිටිගොඩ රබර් වත්ත සිල්වාපුර මාර්ගය |
| *මාර්ගයේ ආරම්භය සහ අවසානය* | :- | වැලිකුඹුර දෙලහිටියාව ප්‍රධාන මාර්ගයේ සිට ඉඩම් කට්ටි අංක 10 ඉඩම දක්වා |
| *ග්‍රාමසේවා වසම හා අංකය* | :- | අංක 47සී මෝරාගම්මන |
| *මාර්ගයේ දිග හා පළල* | :- | මීටර් 198, අඩි 08 |

| | | |
|---|---|---|
| *මාර්ගයේ නම* | :- | තල්ගස්පිටිය බැම්මේ කඩේ අසල සිට උඩුදෙනිය පල්ලිය පාර දක්වා මාර්ගය |
| *මාර්ගයේ ආරම්භය සහ අවසානය* | :- | තල්ගස්පිටිය බැම්මේ කඩේ අසලින් උඩුදෙනිය පල්ලිය පාර දක්වා |
| *ග්‍රාමසේවා වසම හා අංකය* | :- | අංක 44සී තල්ගස්පිටිය, මුස්ලිම්ගම |
| *මාර්ගයේ දිග හා පළල* | :- | මීටර් 455, අඩි 08 |

| | | |
|---|---|---|
| *මාර්ගයේ නම* | :- | දිප්පිටිය හෙම්මාතගම මාර්ගයේ තල්ගස්පිටිය මුස්ලිම්ගම බෝක්කුව අසලින් දෙළ කඳහේන වත්ත දක්වා මාර්ගය |
| *මාර්ගයේ ආරම්භය සහ අවසානය* | :- | තල්ගස්පිටිය හෙම්මාතගම මාර්ගයේ මුස්ලිම්ගම බෝක්කුව අසලින් දෙළකඳහේන වත්ත දක්වා |
| *ග්‍රාමසේවා වසම හා අංකය* | :- | අංක 44සී තල්ගස්පිටිය, මුස්ලිම්ගම |
| *මාර්ගයේ දිග හා පළල* | :- | මීටර් 450, අඩි 10 |

| | | |
|---|---|---|
| *මාර්ගයේ නම* | :- | උඩගම අගලකොටුව මාර්ගය |
| *මාර්ගයේ ආරම්භය සහ අවසානය* | :- | අරණායක උඩගම මාර්ගයේ ඇලික්ලෑන්ඩ් වත්ත සිට අගල කොටුව කුඹුර ඇල දක්වා |
| *ග්‍රාමසේවා වසම හා අංකය* | :- | අංක 43ඊ උඩගම |
| *මාර්ගයේ දිග හා පළල* | :- | මීටර් 560, අඩි 08 |

10-333

## දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාව

වර්ෂ 2016 වැඩසටහන් අයවැය ලේඛනය

මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරියේ) 212 ඡේදය ප්‍රකාර, දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාවේ 2016 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය 2015 වර්ෂයේ ඔක්තෝබර් මස 12 වැනි දින සිට ඔක්තෝබර් මස 18 වැනි දින දක්වා කාර්යාලීය වේලාව තුළදී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ධනසිරි අමරතුංග,
නගරාධිපති,
දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාව.

2015 ඔක්තෝබර් මස 09 වැනි දින,
දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාව.

10-376

---

## කිරින්ද-පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

පොදු සුසාන භූමි සහ පෞද්ගලික සුසානභූමි ආඥා පනතේ 11 පරිච්ඡේදයේ 5(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම්

පොදු සුසාන භූමි සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳ 1946 අංක 57 දරන ආඥාපනතේ 11 පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහත උපලේඛනයේ දක්වෙන සුසානභූමි මල මිනී වැළලීම පිණිස පොදු සුසාන භූමියක් වශයෙන් ගරු ප්‍රධාන ඇමති ගුස්තිඤ්ඤා වඩු ෂාන් විජයලාල් ද සිල්වා මහතා විසින් ප්‍රකාශයට පත් කර ඇත.

ඩී, කේ. දයාසීලී,
කිරින්ද-පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම්.

2015 ජූලි මස 17 වැනි දින,
කිරින්ද-පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව.

### උපලේඛනය

| අනු. අංකය | සුසාන භූමියේ නම | පිහිටීම | පිඹුරුපත් අංකය හා දිනය | ඉඩමේ ප්‍රමාණය | මායිම |
|---|---|---|---|---|---|
| 01 | ආඩියාකන්ද වත්ත පොදු සුසාන භූමිය | කිරින්ද මගින් ඉහල මධ්‍යම | 3382 2014.11.14 | රූඩ් 01 පර්චස් 22.50 | උතුරට - කැබලි අංක 15(පාර), නැගෙනහිරට - කැබලි අංක 15 (පාර), දකුණට - කැබලි අංක 04 ඉතිරි කොටස, බටහිරට - ප්‍රාදේශීය සභා මාර්ගය |

10-357

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.